

# සාතිශය සංවේගය

## නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් පෙනී සිටින සමාජ ක්‍රියාකාරීන් වෙත මරණ තර්ජන එල්ල වෙයි

ශ්‍රීලාල් සෙනෙවිරත්න



**'ජනවාරි 8 විප්ලවයට' දායක වූ ප්‍රතිසංස්කරණවාදීන්ට දෙවන වතාවටත් මරණ තර්ජන එල්ල වන්නේ ප්‍රසිද්ධියේය. ඒ මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්නගෙන්ය. ඊළාම් යුද්ධයේ අවසන් සටන් පෙරමුණේ ප්‍රමුඛයෙකු වූ යුද හමුදා නිලධාරියෙකු වන ඔහුද රට නැවතත් රාජපක්ෂලාට පැවරීමේ සටන් පෙරමුණේ ප්‍රමුඛයෙකි. ඔහු විසින් සිදු කළ සහ තවදුරටත් සිදුකරමින් සිටින මරණ තර්ජනය සරත් වීරසේකර කළ මරණ තර්ජනයටත් වඩා පුරවැසියන් තැතිගන්වන සුළුය.**

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් පෙනී සිටින සමාජ ක්‍රියාකාරීන් වෙත මරණ තර්ජන එල්ලවීම 2015 ජනවාරි 08 රටේ සිදුවූ දේශපාලන වෙනස හෙවත් 'ජනවාරි 8 විප්ලවය', ප්‍රතිවිප්ලවය මගින් පරාජය කරනු ලැබ ඇති බව තවදුරටත් තහවුරු කරයි. එලෙස මරණ තර්ජන එල්ලවීම ආරම්භ වන්නේ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩල මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ අරඹයා ඇතිවන සමාජ සංවාදයට දායක වන ප්‍රතිසංස්කරණවාදී සමාජ ක්‍රියාකාරීනට්ය. හෙවත් රට තුළ නව ශීලාචාර දේශපාලන සංස්කෘතියක් ගොඩනැගිය යුතු බවටත්, ඒ සඳහා මූලික පියවරක් ලෙස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගත යුතු බවටත් වන මතය වෙනුවෙන් පෙනී සිටින්නන්ටය.

මුලින්ම එලෙස ප්‍රසිද්ධියේ මරණ තර්ජනයට ලක්වූ සමාජ ක්‍රියාකාරිකයා වූයේ ආචාර්ය ගාමිණී වියන්ගොඩය. 'පුරවැසි බලය' සංවිධානයේ සම කැඳවුම්කරුවෙකු වන ඔහු 'ජනවාරි 8' වෙනස සඳහා රට තුළ ජන මතයක් ගොඩනැගීම සඳහා කටයුතු කළ ප්‍රමුඛ පුරවැසියෙකි. සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය තුළ මාදුළුවාවේ සෝභිත හිමියන් ඉටු කළ කාර්යභාරය සම කළ හැකි කාර්යභාරයක් 'පුරවැසි බලය' සංවිධානය තුළ ඉටු කළ පුද්ගලයා වූයේ ආචාර්ය වියන්ගොඩය.

සති කිහිපයකට ප්‍රථමයෙන් වියන්ගොඩට මරණ තර්ජන එල්ල කෙරුණේ ප්‍රසිද්ධියේය. දහස් ගණනක් ජනතාවගේ දෑස් ඉදිරිපිටදීය. ඒ, ඔහු එක්තරා රූපවාහිනී නාලිකාවක දේශපාලන සංවාද වැඩසටහනකට සහභාගි වූ අවස්ථාවේදීය. නිමිත්ත වූයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා ජනතාවට කරුණු දැක්වීමය. ඔහුගේ කරුණු දැක්වීම අවසානයේ එම වැඩසටහනට සහභාගිවී සිටි විශ්‍රාමික නාවික හමුදා නිලධාරියෙකු වන රියර් අද්මිරාල් සරත් වීරසේකර ප්‍රකාශ කළේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමට දැරෙන ප්‍රයත්නය රට දෙකඩ කිරීමට දැරෙන ප්‍රයත්නයක් බවය. එබැවින් එය දේශයට ද්‍රෝහීවීමක් බවත්ය. කිසිවෙකු හෝ දේශයට ද්‍රෝහී වන්නේ නම් ඔහු දේශ ද්‍රෝහියෙක් බවද, එවැනි දේශ ද්‍රෝහියෙකුට හිමිවන දඬුවම මරණ දඬුවම බවද, එය ඉදිරියේදී බිහිවනු ඇති 'දේශප්‍රේමී ආණ්ඩුවක්' මගින් අනිවාර්යෙන්ම ලබාදෙනු ඇති බවද අද්මිරාල් සරත් වීරසේකර අවධාරණාත්මකව ප්‍රකාශ කළේය.

සරත් වීරසේකර යනු 'ජනවාරි 8' විප්ලවයේදී පරාජිත මහින්ද රාජපක්ෂ දේශපාලන කඳවුර නියෝජනය කළ අයෙකි. නැවතත් රාජපක්ෂ පාලනයක් රට තුළ ඇති කිරීම සඳහා පෙරමුණ ගෙන කටයුතු කරන අයෙකි. ඔහුගේම වචනයෙන් කියන්නේනම් 'රණ විරුවෙකි.' ශිෂ්ඨසම්පන්න සමාජ දේශපාලනික ප්‍රතිසංස්කරණවලට එරෙහිව සිංහල බෞද්ධ ජාතිකවාදය සහ 'රණවිරු' අයිතිවාසිකම් වෙනුවෙන් පමණක් පෙනී සිටින්නෙකි.

මෙම මරණ තර්ජනය ආචාර්ය වියන්ගොඩ පමණක් ඉලක්ක කොට ගත්තක් නොවේ. 'ජනවාරි 8' දේශපාලන වෙනස සඳහා දායක වූද, තවදුරටත් ඒ වෙනුවෙන් පෙනී සිටින්නන්වද ඉලක්ක කරගත්තකි. සරත් වීරසේකර 'රණවිරුවා' විසින් 'දේශ ද්‍රෝහීන්' යන්නට සපයා ඇති අර්ථ විවරණයෙන් ඒ බව පැහැදිලි වේ. මේ වන විට රාජපක්ෂ කඳවුර විසින් නව ව්‍යවස්ථාවට එරෙහිව අරඹා ඇති විරෝධතා රැස්වීම්ල ඉදිරි පෙළ කථිකයෙකු ලෙස සහභාගි වෙමින් ඔහු මේ අදහස නැවත නැවතත් අවධාරණාත්මකව ඉදිරිපත් කරමින් සිටීමෙන්ද එය තහවුරු වේ.

'ජනවාරි 8 විප්ලවයට' දායක වූ ප්‍රතිසංස්කරණවාදීන්ට දෙවන වතාවටත් මරණ තර්ජන එල්ල වන්නේ ප්‍රසිද්ධියේය. ඒ මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්නගෙන්ය. ඊළාම් යුද්ධයේ අවසන් සටන් පෙරමුණේ ප්‍රමුඛයෙකු වූ යුද හමුදා නිලධාරියෙකු වන ඔහුද රට නැවතත් රාජපක්ෂලාට පැවරීමේ සටන් පෙරමුණේ ප්‍රමුඛයෙකි. ඔහු විසින් සිදු කළ සහ තවදුරටත් සිදුකරමින් සිටින මරණ තර්ජනය සරත් වීරසේකර කළ මරණ තර්ජනයටත් වඩා පුරවැසියන් තැතිගන්වන සුළුය. ඔහු ප්‍රසිද්ධියේම කියා සිටියේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් කටයුතු කරන්නන් (දේශ ද්‍රෝහීන්) මරා දමා ඔවුන්ගේ අවසන් කටයුතු සිදුකළ යුත්තේ ජනතා විමුක්ති පෙරමුණ 88-89 භීෂණ සමයේ ''දේශ ද්‍රෝහීනට'' මරණ දඬුවම දුන් ආකාරයට බවය. සිය ගණනක් ජනතාව සහ ජනමාධ්‍ය ඉදිරියේ ඔහු එය විස්තර කළේ මෙසේය.

''ඔය කියන ව්‍යවස්ථාව ගෙනාවොත් ඒකෙන් වාසිය, සුගතිය අත්වෙන්නේ වෙන කාටවත් නොවෙයි උතුරේ සිටින දේශපාලනඥයන් කිහිප දෙනෙකුටයි. මම කතා කරන්නේ හදවතින්. දේශයේ දරුවන් ලෙස ඉපිද, දේශය නසන්නට තැත්කරන්නන් දේශද්‍රෝහීන්. දේශද්‍රෝහීන්ට හිමිවිය යුතු දඬුවම මරණයයි. 88-89 ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදය කාලයේ දේශද්‍රෝහීන් කියලා මරපු මිනිස්සුන්ගේ මිනිය කනත්තට ගෙනියනකොට පොළොවෙන් අඟල් හයකට වැඩිය උස්සන්න දුන්නේ නෑ. කඹ දාලා උස්සන් ගියේ. එහෙනම් මේ දේශද්‍රෝහීන්ගේ මිනියටත් ආචාර දැක්විය යුත්තේ එහෙමයි.''

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමට දැරෙන උත්සාහය පසුපස සිටින ප්‍රධාන පිරිස 'ජනවාරි 8 වෙනසට' දායක වූ දැනුම්වත් පුරවැසි ප්‍රජාව සහ එදා ඒ සමඟ එක්ව සිටි දේශපාලන පක්ෂ සහ ක්‍රියාකාරිකයන්ය. මන්ද නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම යනු ජනවාරි 8 දේශපාලන වෙනසට මුල්වූ ජනතා අභිලාෂයේ අවසන් අවසන් බලාපොරොත්තුව වන බැවිනි.

'ජනවාරි 8' වෙනසේදී ජනතා අභිලාෂය වූයේ රට තුළ දියුණු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයක් සහ ශීලාචාර දේශපාලන සංස්කෘතියක් ගොඩනගා ගැනීමය. එය පුළුල් සමාජ දේශපාලනික වපසරියක පැතිර ගිය ජනතා පාර්ථනාවක් විය. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, නීතියේ අධිපතිත්වය යළි ස්ථාපිත කිරීම, දිගුකාලීන සංහිඳියාවක් සඳහා වන බලය බෙදීම, අල්ලස දූෂණය වංචාව පිටුදැකීම සහ ඒවායේ නිරතවූවන්ට නීතිය ක්‍රියාත්මක කිරීම, රාජපක්ෂ පාලන කාලයේ සිදු වූ අපරාධ විමර්ශනය කොට යුක්තිය ඉටු කිරීම ආදීය ඊට ඇතුළත් ප්‍රමුඛ කාරණා විය.

මහින්ද රාජපක්ෂ රටේ යාවජීව රාජ්‍ය නායකයා බවට පත්කරගැනීම සඳහා කැඳවන ලද 2015 ජනාධිපතිවරණයේදී හැට දෙලක්ෂ දාහත් දහසක් ඉක්ම වූ බහුතර ජනතාවක් පොදු අපේක්ෂකයෙක් ජනාධිපති ධූරයට පත් කොට ගන්නේ ඒ සඳහාය. මහින්ද රාජපක්ෂ ඉවත් කොට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති අසුනේ හිඳුවා වසර තුනකට ආසන්න කාලයක් ගෙවී ගියද ඒ එකදු ජනතා ප්‍රාර්ථනාවක් හෝ අපේක්ෂිත අයුරින් ඉටු කර දෙන්නට සිරිසේන ජනාධිපතිවරයා සමත්වී නැත. ඉටු කරනු ඇති බවක් හෝ ඉටු කිරීම සඳහා වන අවංක වුවමනාවක් ඔහුට ඇති බවක් හෝ පෙනෙන්නට ද නැත. සාපේක්ෂ වශයෙන් අඩු වටිනාකමක් ඇති සීමිත ප්‍රතිසංස්කරණ කිහිපයක් සිදු කරනු ලැබ ඇතත් සිරිසේන ජනාධිපතිවරයා ආරම්භයේ සිටම කටයුතු කරමින් සිටින්නේ ජනවරමට එරෙහිව යන පෞද්ගලික න්‍යාය පත්‍රයක් අනුවය.

එහි ප්‍රතිපලයක් ලෙස සිදුවීම් පෙළගැසෙමින් තිබෙන්නේ 2020 දී නැවත ජනාධිපතිවරණයක් සහ අනතුරුව මහ මැතිවරණයක් පවත්වා තවදුරටත් පැවැති ක්‍රමයම ඉදිරියට ගෙනයාම දෙසටය. මේ මහත් ඛේදජනක තත්ත්වය කිසියම් ප්‍රමාණයකට හෝ වෙනස් කළ හැකි එකම සහ අවසන් අවස්ථාව වන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමය.

අභියෝගාත්මක වුවද එය ජයගත හැකිනම් රට නැවත රාජපක්ෂ යුගයකට ගමන් කිරීමෙන් යම් දුරකට හෝ වළක්වා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. එහිදී විවර වන අවකාශය තුළ තවත් පියවරක් හෝ 'ජනවාරි 8' ජනතා අභිලාෂය දෙසට තැබීමට පුරවැසියන්ට අවස්ථාවක් හිමිවනු ඇත.

එහෙත් පරාජිත බලවේගය නව ජවයකින් පෙරට පැමිණ සිටින්නේ එය වැළැක්වීමටය. මුලදී 'ඒකීය රාජ්‍ය' සහ 'බුද්ධගමට පුමුඛස්ථානය' යන කරුණු මුල් කොට ගනිමින් ආරම්භ කළ ව්‍යවස්ථා විරෝධය මේ වන විට කොන්දේසි විරහිත ව්‍යවස්ථා විරෝධයක් බවට පත්ව තිබේ. 'ඒකීය රටක්' සහ 'බුද්ධාගමට ප්‍රමුඛස්ථානය' පවතින ආකාරයෙන්ම තිබෙන්නට හරිමින් වුවද නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමට කිසිසේත් ඉඩ නොතැබිය යුතු බව පවසන 'රාජපක්ෂ ප්‍රජාව' ඒ සඳහා මරන්නට පමණක් නොව මරාගෙන මැරෙන්නට වුවද සූදානමින් පෙරට පැමිණ සිටී. නව ව්‍යවස්ථාවක් සම්මත කළ හොත් පාර්ලිමේන්තුවට බෝම්බ ගැසිය යුතු බවට විමල් වීරවංශ කළ ප්‍රකාශය පසුව සුසිල් ප්‍රේමජයන්ත ඇමැතිවරයා සහ වීරවංශගේ කණ්ඩායමේ පිරිස් විසින් පුනරුච්චාරණය කොට තිබීමෙන් පෙනී යන්නේද එහි ඇති බිහිසුණුකමය.

ජනවාරි 8 වෙනසින් වසර දෙක හමාරක් ඉක්ම යන විට එම වෙනස මහින්ද රාජපක්ෂ වෙනුවට මෛත්‍රීපාල සිරිසේන පත්කර ගැනීමකට ලඝු වී තිබීම පුරවැසියන් වශයෙන් අප කවුරුත් සාතිශය සංවේගයට පත්විය යුතු තත්ත්වයකි. මේ වන විට රට තුළ සෑම දෙයක්ම පාහේ සිදුවන්නේ රාජපක්ෂ පාලන කාලයේ සිදුවූ ආකාරයටමය. විකල්ප දේශපාලන මතධාරීන්ට මරණ වරෙන්තු පවා නිකුත්වීම ඇරඹී ඇත. අඩුවකට ඇත්තේ සුදු වෑන් මගින් පැහැර ගෙනයාම සහ ඝාතනයන් වාර්තා නොවීම පමණකි. අගමැතිවරයා කිසියම් ප්‍රමාණයකින් හෝ මේ කරුණු පිළිබඳ සංවේදී බවක් දැක්වුවද 'පොදු අපේක්ෂක ජනාධිපති' මෛත්‍රීපාල සිරිසේන කටේ කෙළ බිඳක් හෝ වැටෙන්නට අවස්ථාවක් දෙන්නේ නැත. මෙම බිහිසුණු අනතුර පරාජයට පත් කිරීම සඳහා පුරවැසි ප්‍රජාව කඩිනමින් නැවත එක් කඳවුරකට එක්විය යුතුව ඇත.